---

මිනුවන්ගොඩ නගර සභාව
ගම්පහ දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 13 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ඔක්තෝබර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මිනුවන්ගොඩ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මිනුවන්ගොඩ නගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ලැබුණු මුද්දර ආදායම රු.4,025,035 ක් වුවත්, එය රු.7,415,720 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ආ) කැබ් රථයක් මිළදී ගැනීම සඳහා පළාත් ආදායම් කොමසාරිස් කාර්යාලයෙන් ලැබී තිබූ රු.6,100,000 ක ණය මුදල ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයිතම 06 කට අදාලව ගෙවිය යුතු රු.15,494,383 ක වියදම් උපචිත වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

---

(ඇ) සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු (හිලව් කලහැකි) එකතු කල අගය මත බදු රු.429,439 ක ශේෂය නගර සභාවේ ආයෝජන ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ඩබල් කැබ් රථය අලුත්වැඩියාව සඳහා වියදම් කර තිබූ රු.740,325 ක් වියදම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඊ) දීර්ඝ කාලයක සිට කර්මාන්ත 10 ක් සඳහා ණය හිමියන් ලෙස රු.5,961,474 ක් ඉදිරියට ගෙන ගොස් තිබුණද, කර්මාන්ත නිමවී ඇතත්, එවා ණය හිමි ලෙස ගිණුම් වල පෙන්වා තිබුනි. තවද පසුගිය වර්ෂයේ වැඩ නිමකල කර්මාන්ත හතරක් සඳහා වූ රු.179,335 ක් ණය හිමි ලෙසට ගිණුම්වල දක්වා තිබුණි.

(උ) මිනුවන්ගොඩ මණමින මාවත ප්‍රතිසංස්කරණය හා ජේදික් මාවත කොන්ක්‍රීට් කිරීම සඳහා වියදම් කර තිබූ රු.1,731,864 ක් ගිණුම් වලින් අත්හැරි තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.40,303,896 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 12 ක ට අදාලව පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.66,110,157 ක් වූ අතර, ඒවාට අදාල උපයෝගී ලේඛණ/වාර්තා අනුව ශේෂයන්ගේ එකතුව රු.44,737,719 ක් විය.

## 2. මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මව ආදායම රු.12,712,358 ක් වු අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියඋම ඉක්මවු ආදායම රු.6,018,257 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

අතුරු අග්‍රිමයක් අදාල කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත්, එසේ පියවීමට කටයුතු කර නොතිබු රු.8,426,564 ක් වර්ෂය අවසානයේ පෙර ගෙවුම් ශේෂය තුළ ඇතුලත් **විය.**

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 |
| (i.) | වරිපනම් හා බදු | 7,783 | 8,551 | 7,442 |
| (ii.) | බදු කුලී | 9,495 | 11,196 | 1,410 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 477 | 855 | 01 |
| (iv.) | වෙනත් ආදායම් | 6,177 | 13,202 | 4,661 |

නගර සභා ආඥා පනත (255 අධිකාරය)170 අ (2) වගන්තිය ප්‍රකාර සභාවට අයවිය යුතු ගාස්තු හෝ වෙනත් ගෙවීම් අයකරගෙන එය නගර සභාවේ අරමුදල්වලට බැර කිරීම සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම සභා ලේකම්ගේ කාර්යය වුවත්, සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු වරිපනම් රු.7,441,584 ක්, අයවිය යුතු වෙනත් ආදායම් රු.6,071,927 ක්, අයවිය යුතු කඩකුලී රු.5,512,557 ක් හා අයවිය යුතු ගෙවල් කුලී රු.396,945 ක් අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගෙන නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් ආවරණය නොවූ ගණුදෙනු

1995 මාර්තු 09 දිනැති අංක.එල්ජීඩී/95/4 බසනාහිර පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයට අනුව ස්ථාවර තැන්පතු ආපසු ගැනීම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, රු.6,000,000 ක ස්ථාවර තැන්පතු මුදල 2012 ජූලි 27 දින පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය රහිතව ආපසු ලබා ගෙන තිබුණි.

2.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2008 ජූලි 30 දිනැති අංක 1560/6 ගැසට් පත්‍රයේ පළකර ඇති 2008 අංක 01 දරණ "ඝන අපද්‍රව්‍ය කළමණාකරණ රීති" සියළුම පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කළයුතු බවට 2010 දෙසැම්බර් 21 දිනැති

---

අංක එල්ජ්ඩී/05/08/පොදු/වෙළුම හා පළාත් පාලන කොමසාරිස්, (බස්නාහිර පළාත) ලිපියෙන් දැනුම් දී තිබුනද, සභාව ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර, වියදම ලෙස රු.10,797,000 ක ඇස්තමේන්තුවක් තිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) නගර සභාව සතු කි.මී.20 කට අඩු ප්‍රමාණයක මාර්ග සංවර්ධනය වෙනුවෙන් රු.1,500,000 ක් ඇස්තමේන්තු කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) 2012 ඔක්තෝබර් 15 සිට 2012 ඔක්තෝබර් 25 දින දක්වා දින 07 ක් පුරා, දිප ව්‍යාප්තව පැවැත්වීමට සැලසුම් කර තිබූ පළාත් පාලන සතිය වෙනුවෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2003 ජුනි 02 දින හා අංක පීඩ්බී/12 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ජේදය ප්‍රකාරව සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 05 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

---

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය